*Sri Lankan Journal of Arabic and Islamic Studies, 5(Special Issue I) 2022*
*Published by Faculty of Islamic Studies and Arabic Language, ISSN: 2550:3014*
*Accepted: 21st September 2022*

# THE CONTRIBUTION OF MUSLIMS TOWARDS THE ECONOMIC SECTOR OF SRI LANKA BEFORE THE RULING PERIOD OF 1815 A.D.

## ක්‍රි.ව. 1815 ට පෙර පැවති පාලන සමයේ ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයට මුස්ලිම්වරුන් දැක්වූ දායකත්වය

[1] M.N.M. Minaz* [2] S.M.M. Mazahir [3] M.J.F. Nilfa & [4] M.A.B. Ahmad
[1, 2, 3 & 4] Department of Islamic Studies, Faculty of Islamic Studies and Arabic Language,
South Eastern University of Sri Lanka, Oluvil
*Correspondence: minazsrilanka@gmail.com

**Abstract**

*Sri Lanka is a nation which consists of a diverse population. Numerous political, social, economic and cultural events of its history have influenced in this diversity. Accordingly it is important to examine the services rendered by different nations to this land in order to build up the Sri Lankan nation which has been built on a great diversity at present. For that purpose this study was conducted using ancient literary text written about history reveals the study of the contribution of Muslims towards the economic sector of Sri Lanka during the Sinhalese rule. Here the research has been done by collecting and referring the written literatures related to history. Accordingly this study depicts that the Muslims have uplifted the domestic trade and manufacturing segment through various fields as well as they have given glory to Sri Lanka by aiding politically during the period of economic difficulties. Furthermore, they have contributed through diplomatic relations, by creating new economic opportunities, by implementing tax policies which raised the state revenue and by developing transportation sectors such as shipping, irrigation and port sectors. Accordingly, this research has been done by collecting data from written historical literatures. Thus it is possible to buildup harmony and unity among the people living Sri Lanka and reminds the society about the hidden history by showing them the sacrifices done by different religious groups for the betterment of the Sri Lankan nation. Also different nationalities can get along with the future of the country by reminding them about the immortal services given to this motherland by the people with their own identity.*

Keywords: Sri Lanka, Business, Kingdom, Muslims, History

### 1. හැදින්වීම

ඉතිහාසය යනු අතීත තොරතුරු ඇතුලත් වාර්තාවකට එහා ගිය ඓතිහාසික කතාන්දරයකි. අප ගත කරන වර්තමානය යනු අපගේ ඉතිහාසයේ අප කළ කී දෑ හි ප්‍රතිඵලයකි. එම ශේෂ වූ තොරතුරු වර්ථමානයේ ජීවත් වීමටත් අනාගතයේ අපගේ පැවැත්ම කෙරෙහිත් බලවත් ලෙස බලපානු ලැබේ. එය අපගේ මානව වංශ කතාවයි. රමණීය ඉන්දියන් සාගරයේ නාවුක කේන්ද්‍රස්ථානයක පිහිටා ඇති ශ්‍රී ලංකා දේශය අතීතයේ මෙන්ම වර්ථමානයේදී ද ලෝකයට වැදගත් වූ ස්ථානයකි. මෙය වටා ගෙතී ඇති ඉතිහාසය වර්ශ 2500ක් තරම් වූ ඈතට දිව යන තරමට පෞරාණිකය. ඒ අතුරින් මෙම පර්යේෂණ ලිපියෙන් ආවරණය කිරීමට සැරසෙනුයේ හෙළදිව රජ දවස දේශීය ආර්ථිකයට මුස්ලිම්වරුන් දැක්වූ දායකත්වය පිළිබඳ

විමසුමකි. ඒ අනුව මුස්ලිම්වරු විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලාංකිය ආර්ථිකයට දැක්වූ දායකත්වයන් වෙන වෙනම මෙහි ගොනු කර දක්වා ඇත.

## 2. පර්යේෂනයේ අරමුණ

ක්‍රි.ව. 1815 ට පෙර ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා ඉතිහාස වංශ කතාවේ මුස්ලිම්වරුන් දැක් වූ දායකත්වය සොයා ගැනීම මෙම පර්යේෂණයෙන් අරමුණයි.

## 3. පර්යේෂන ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ ප්‍රධානතම පර්යේෂන ක්‍රමවේදය ඉතිහාසය ආශ්‍රිත ලිඛිත මූලාශ්‍ර උපයෝගී කර ගනිමින් දත්ත රැස් කර විශ්ලේෂණය කිරීමයි. පසුව විශ්ලේෂිත දත්ත විවිධ මාතෘකා යටතේ ගොනු කර ඉදිරිපත් කර ඇත.

## 4. සාහිත්‍ය විමර්ශනය

ශ්‍රී ලංකා වැනි බහු සංස්කෘතික ජන සමාජයක් තුළ සිංහල, දෙමළ, මුස්ලිම් හා ක්‍රිස්තියානි යන ජාතීන් ජීවත් වෙති. ශ්‍රී ලංකාවේ එක් එක් ජාතීන්ගේ මූලාරම්භය හා විකාශනය පිළිබඳව බොහෝ අධ්‍යනයන් සිදු කළ ද ශ්‍රී ලංකාවේ  මුස්ලිම්වරුන්ගේ මූලාරම්භය පිළිබඳ නිශ්චිත යැයි කාල වකවානුවක් නැත. නමුත් ඉස්ලාම් ධර්මය බිහි වූ ක්‍රි. ව. 07 වන සියවසට පෙර දීර්ඝ කාලයක සිටම අරාබි ජාතිකයින් වෙළෙඳාම සඳහා ශ්‍රී ලංකාවට පැමිණ ඇති බවත් දීර්ඝ කාලයක් වෙළෙඳ කටයුතු වල නිරත වී ඇති බවත් ඓතිහාසික සාධක අනුව පෙනී යයි. පෙරදිග හා අපරදිග යා කරන මුහුදු මාර්ගයේ කේන්ද්‍රස්ථානය වූ ශ්‍රී ලංකාවේ එවකට වැඩි වශයෙන් භාවිත වූ බව පෙනී යන්නේ මාතොට (මන්නාරම) සහ ගෝකන්න  (ත්‍රිකුණාමලය) වරායන් බව පෙනී යයි.  මෙම වරායන් යා කළ අනුරාධපුරය හරහා පැවැති මාර්ගය පිළිබඳව, එම මාර්ගයේ ඉදිකර තිබු ගල් පාලම් වල නටඹුන් සඳහන් වේ. මෙම වෙරළ තීරයන් යා කරමින් ගොඩබිමින් තිබූ මාර්ග වලට අමතරව ඒ සඳහා ගංගා භාවිත කළ බව ද පෙනීයයි. (නියාස්  මොහමඩ්, 2021) ලංකාවේ රජවරුන් අරාබි රාජ්‍යයන් හි කාලිෆ් වරුන් සමග සමීප සම්බන්ධතා පවත්වා ඇත. (අබේකෝන්, 1949) මෙසේ ඉස්ලාමීය අරාබි ජාතිකයන් 08 වන සියවසේ සිට 16 වන සියවස දක්වා විටින් විට ලංකාවේ නොයෙකුත් ප්‍රදේශවල විශේෂයෙන්ම සමුද්‍රාසන්න ප්‍රදේශවල සිය ජනාවාස ඇති කරගත්හ. "කොළඹ සහ මන්නාරම මුස්ලිම් සුසාන භූමි වලින් හමු වී ඇති ක්‍රි.ව. 10 වන සියවසට අයත් ශිලා ස්ථම්භ දෙකකින් හෙළිදරව් වන සාධක අනුව කොළඹ වරාය ආශ්‍රිතව සහ දිවයිනේ මුහුදු බඩ බොහෝ පෙදෙස්වල මුස්ලිම් ජනාවාස මෙන්ම ආගමික ස්ථාන ද පවතින්නට ඇති බව හෙළිදරව් වී ඇත." (නියාස් මොහමඩ්, 2021) මුස්ලිම් රාජ පරම්පරාවන් වල රාජ්‍ය මුද්‍රා සහිත කාසි විශාල ප්‍රමාණයක් මුහුදු බඩ පළාත් වලින් මෙන්ම මධ්‍යම කඳුකරයේ බොහෝ ස්ථානවලින් ද රට තුළ තවත් බොහෝ ප්‍රදේශ වලින්ද සොයා ගැනීම මගින් පෙන්නුම් කරන්නේ ක්‍රි.ව. 10 වන  සියවස පමණ වන විට දිවයිනේ විවිධ පෙදෙස්වල මුස්ලිම් ජනයා වාසය කර ඇති බවය. මුල් කාලීනව වෙළඳාම මුල්කොට ගෙන ශ්‍රී ලංකාවට පැමිණි අරාබි වෙළඳුන් මුහුදුබඩ ප්‍රදේශවල පදිංචි වූ අතර ඒ ප්‍රදේශ වල ලුණු කර්මාන්තයන්, ඇඳුම් විවීමේ කර්මාන්තයන් ආරම්භ කරන ලදී. එලෙසම වෙළඳාම අරමුණින් ශ්‍රී ලංකාවට පැමිණ අරාබිවරුන් පසුකාලීනව දේශීය කාන්තාවන් විවාහ කර තම පරම්පරාව ද ශ්‍රී ලංකාව තුළ බිහි කරන ගත්හ. සිංහල රාජ සමයේ මෙම අන්‍යාගමිකයින්ට මෙන්ම අන්‍ය ජාතිකයින්ට පවා නිදහසේ ජීවත් වීමටත් තමන් අදහන ලබ්ධිය නිදහසේ ඇදහීමටත් නිදහස තිබූ බව තහවුරු වන ඓතිහාසික මූලාශ්‍ර රාශියක් වේ. ක්‍රි. පූ. පස්වන සියවසේ පණ්ඩුකාභය රජ (ක්‍රි. පූ. 437) සමයේ විවිධ ආගමිකයන්ගේ පූජනීය ස්ථාන ඉදි කිරිම සඳහා අනුරාධපුර අගනුවර පිහිටු වීමේ දී සුදුසු ස්ථාන වෙන් කළ බව මහා වංශයේ 10 පරිච්ඡේදයේ විස්තර කර ඇත.

“ලංකා යෝනකවරුන්ගේ මුලාරම්භය ශත වර්ෂ ගණනාවක් ඈතට විහිදේ. අබ්දුල් මලික් බින් මර්වාන් කාලිෆ්වරයාගේ වධ හිංසා වලින් බේරීම සඳහා ඇතැම් අරාබි ජාතිකයෝ ලංකාවට (සෙරන්ඩිබ්) පැමිණ ත්‍රිකුණාමලය, යාපනය, මන්නාරම, පුත්තලම, කොළඹ, බේරුවල සහ ගාල්ල යන ප්‍රදේශ වල පදිංචි වූහ. ඉතිහාසයට අනුව යෝනකවරුන්ගේ විශාලතම ආගමනය සිදු වූයේ පළමු වන බුවනෙකබාහු රාජ්‍ය පාලන කාලයේ අට වන වර්ෂයේදීය. අලුතින් පැමිණි මේ අමුත්තන්ට පුත්තලමේ සිට බේරුවල දක්වා සමුද්‍ර තීරයේ ගම්මාන වල පදිංචි වීමට සහ සිංහල කුල කාන්තාවන් සමඟ විවාහ වීමට පළමු වන බුවනෙකබාහු රජු අවසර දුන්නේය. මුලින් ම ලංකාවට පැමිණි යෝනක ජාතිකයින්ගෙන් පැවතෙන්නන්ගේ සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් වැඩි වී ගියේය. ලංකාවේ මුස්ලිම් වරුන්ගේ මුතුන් මිත්තන් නව වන ශත වර්ෂයේ දී කායල්පට්නම් හි මුල් ජනාවාස පිහිටුවා ගත් අතර ඉන් අවුරුදු ගණනාවකට පසුව 1024 දී එම නගරයෙන් පැමිණි පිරිසක් බේරුවල ජනාවාසයක් පිහිටුවා ගත්තේය, යන මතය කාසිචෙට්ටි විසින් සඳහන් කරන ලදී.” (අබේකෝන්, 1949) ලංකාවට පැමිණි අරාබි මුස්ලිම්වරුන් වෙළෙඳාමේ දියුණු කිරීමේ දී පමණක් නොව ජාතික අභිමානය රැක ගැනීම පිණිස ද මහගු දායාදයක් ඉටුකර ඇත.

“එදා මායාදුන්නේ රජතුමා වෙනුවෙන් සටනට වැද යාපනය අර්ධද්වීපයේ සිට ආපසු පැමිණෙමින් සිටියදී මහ රණවිරු රහ්මාන් සිද්දි ලෙබ්බේ මුදියන්සේ හෙවත් "සිද්දි ලෙබ්බේ" සේනාධිපතිවරයා ඝාතනයට ලක් වන්නේය. ඒ ඝාතනයෙන් පසු මායාදුන්නේ රජතුමාගේ බලය ක්‍රමක් ක්‍රමයෙන් බෙලහීන වන්නට විය. එයම එම ප්‍රදේශයන් පරාජය වීමද සිදුවිය. එසේ පරාජය වී පසු බසින අවස්ථාවේදී පර දේශයෙන් හා ඔවුන්ගේ තැගි බෝග වලට කෑදර වූ ස්වදේශීය පාවාදෙන්නන් හට යටත් නොවී පලා යන්නට විය. පසුපසින් පන්නා එන සතුරන් ලං වන විට සැඟවීමට තැනක් සොයා දෙන ලෙස අසල දිය නාමින් සිටි මුස්ලිම් කාන්තාවන් ගෙන් උදව් ඉල්ලා සිටින ලදී. එම අවස්ථාවේදී එම කාන්තාව රජතුමා ආරක්ෂාකාරී ස්ථානයක තබන ලදී. මේ බව දැනගත් සතුරු සේනාව එන කාන්තාව අත්අඩංගුවට ගෙන ඇයට නොයෙකුත් වධ දී ප්‍රශ්න කරන ලදී. නමුත් එහිදී ඇය වචනයක් හෝ පිට නොකල බැවින් අවසානයේදී ඇයගේ අවයව එකිනෙක කපා දමමින් ප්‍රශ්න කළත් ඇය තුලින් එකදු වචනයක් හෝ ගත නොහැකි විය. රජතුමා ආරක්ෂා කරන අය එම ස්ථානයේම ඝාතනය වූයේ සමස්ත මුස්ලිම් වරුන්ගේ ජාතිකාභිමානය ආරක්ෂා කරමිනි. සියල්ලම සැඟවී බලා සිටි රජතුමා ඇයට උපහාරයක් වශයෙන් ඒ ජන සමූහයාට ම "මා රැක්ක ලේ" යන නම්බු නාමය ප්‍රදානය කරන ලදී. "මරක්කලයන්" බවට පද පෙරළියකට ලක් ව ඇත්තේ එයයි.” (මුනව්වරුල් අෆ්ලල්, 2014)

ශ්‍රී ලංකාව විදේශිකයින්ගේ ආක්‍රමණයන්ට ලක් වීමට පටන් ගත පසු ඇති වූ සෑම සටනකදීම මුස්ලිම්වරුන් සිංහල රජයට පක්ෂපාතීත්වය ප්‍රකාශ කර ජීවිත පූජාවෙන් සටන් කළ බව ඉතිහාස පොත් පත් වල සඳහන්ය.

“තමා සිටි කාලයේ බේරුවල පදිංචි වී සිටි ඉතාම පැරණි මුස්ලිම් පවුල් වලින් එකක් සතුව පැවති පුරාණ අරාබි ලේඛනයක්, 1926 දී ලියන ලද “සෝනහාර්” නම් වූ සිය කෘතියෙහි ජේ.සී. වැන් උපුටා දක්වයි. එහි දැක්වෙන පරිදි, යේමනයෙහ් රජ පවුලකට අයත් පුතුන් දෙදෙනෙකු ක්‍රි.ව. 604දී ලංකාවට පැමිණ ඇත. ඉන් එක් තැනැත්තෙක් මන්නාරමට ගොඩ බැස අතර අනෙක් තැනැත්තා බේරුවල ගොඩ බැස එහි පදිංචි වී ඇත. ඔහුගෙන් පැවතෙන්නන් බැව් කියා පෑ මුස්ලිම්වරු කිහිප දෙනෙක්ම බේරුවල සිටියහ. “(අබේකෝන්, 1949)

මොහොමඩ් ලෙබ්බේ සහ උදූමා ලෙබ්බේ යන මුස්ලිම් වරුන් දෙදෙනා දළදා මාලිගාවට අයත් පල්ලෙ ගම්පහ කහවත්ත නම් ගමේ ලුණු දෙන පංගුව භුක්ති වින්දාහ. එම පංගුවට අයත් රාජකාරිය වූයේ, අලුත් අවුරුදු මංගල්‍යය සඳහා හොඳ පිරිසිදු ලුණු සේරු 20ක් මාලිගාවට සැපයීමයි. උඩරට රාජධානියේ අවසන් කාලය වන විට ඕලන්ද වරුන් වරායන් පාලනය කරමින් අත්‍යවශ්‍ය වෙළඳාම සීමා කිරීමට උත්සාහ

දරමින් සිටි බැව් සිහිපත් කිරීමේදී මෙම රාජකාරියේ බැරෑරුම් කම වැටහෙනු ඇත. මාලිගාවේ කාර්ය මණ්ඩලයට ආහාර පාන සැපයීම සඳහා ප්‍රමාණවත් ලුණු සහ කරවල තොග තබා ගැනීමට මාලිගාවේ මුලාදෑනීන්ට සිදු විය. දියවඩන නිලමෙ හට කරවල කූරියක සහ බුලත් හුරුල්ලක් (කොළ හතළිහක්) සැපයීමද ඒ රාජකාරියේම කොටසක් විය. බුලත් හුරුල්ලක් පිළිගැන්වීම යමකුගේ හාම්පුතුන් හට ගරුසරු දැක්වීමේ චාරිත්‍රයකි. මේ සිරිත දැනුදු විශේෂයෙන්ම සිංහල අලුත් අවුරුදු සමයේදී ශ්‍රී ලංකාවේදී සිදු කෙරෙනු දැකිය හැකිය. ලුණු සහ කරවල සැපයීම, මුස්ලිම් වරුන් විසින් ඉටු කරන ලද ආගමික හෝ සංස්කෘතික හෝ වැදගත්කමකින් තොර හුදෙක්ම ප්‍රයෝජනය මූලික කර ගත් රාජකාරියක් වශයෙන් සැලකිය හැකිය. කෙසේ වුවද, මාලිගාවට අයත් ගම් වල හේවිසි පංගුව භුක්ති විඳි මුස්ලිම් වරුන් සැහෙන සංඛ්‍යාවක් සිටිය බව සැලකිල්ල යොමු විය යුතු කරුණකි. (ලෝනා දේවරාජ්, 2015). මෙලෙස අරාබිවරුන් ශ්‍රී ලංකාව තුල පැතිරුණු අතර අරාබිවරුන්ගේ දස්කම් හා බුද්ධිමත් භාවයෙන් පුදුමයට පත් වූ එකල ලංකාව පාලනය කර පාලකයින් අරාබි වරුන් හට යම් යම් දෙපාර්තමේන්තුව ඔවුන්ගේ මග වීම මගපෙන්වීම යටතේ පාලනය කරගෙන යෑමට අවසර ලබා දී තිබුණි.

මෙලෙස මුස්ලිම්වරුන්ගේ ආරම්භය ඔවුන්ගේ සබඳතා හා ඔවුන් ශ්‍රී ලංකාව කෙරෙහි දැක්වූ දායකත්වය පිළිබඳව බොහෝ ලිපි, කෘතීන් රචනා වී ඇත. ඒවායෙන් එම්. ඒ. එම් ෂුක්රි විසින් Muslims of Sri Lanka: Avenues to Antiquity, ලෝනා දේවරාජ් විසින් රචිත සහශ්‍රයක ජනවාර්ගික සහජීවනය, මුහම්මද් මන්සූර් දහ්ලාන් විසින් රචිත ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ අතීත පිය සටහන්, මුහම්මද් මුනව්වරුල් අෆ්ලල් විසින් රචිත ඉස්ලාම් සුහදත්වය, ෆස්ලාන් සහ නදීන් වන්නියසිංහම් යන දෙදෙනා විසින් "බිදී යන ප්‍රජාව'' යන පර්යේෂණ ලිපියක් ද, රොබට් නොක්ස් විසින් රචිත An Historical Relation of Ceylon, ජී.වී.පී සෝමරත්න විසින් රචිත Political History of the Kingdom of Kotte යන ග්‍රන්ථ රචනා වී ඇත. මෙම පර්යේෂනයේ ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් අතීත රාජ පාලන සමයේ ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි දැක් වූ දායකත්වය අපට දැකගත හැකිය.

## 5. ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයට මුස්ලිම්වරුන් දැක්වූ දායකත්වය

මුස්ලිම්වරුන් යනු වර්තමාන ශ්‍රී ලංකාවේ තෙවන විශාලතම ජන කොට්ඨාශයයි. ඔවුන්ගේ ආරම්භය පිළිබඳව විමසා බැලීමේදී අපට පර්සියාව, ඉන්දියාව, මොරොක්කෝව ප්‍රමුඛ මැදපෙරදිග හා ගිණිකොණදිග ආසියානු රටවල් ආදී විවිධ රටවල වෙළඳ වාණිජ සබඳතා පිළිබඳ හැදෑරීමට සිදුවේ. මන්ද වෙළඳාම ඔවුන් මෙරටට සංක්‍රමණය වී ජනාවාස වීමට බලපෑ ප්‍රධානතම සාධකය වූ බැවිනි . නමුත් ඔවුන් ඔවුන්ගේ ආර්ථික සුභ සිද්ධිය උදෙසා පමණක්ම නොව දේශයේ ආර්ථිකය නගා සිටුවමින් රට සමෘද්ධිමත් කිරීමේ කාර්යභාරයේ කොටස්කරුවන් වීමට ද වගබලා ගත්හ. ඔවුන් මෙම භූමිය භාණ්ඩ මිලදී ගැනීමටත්, ඒවා හුවමාරු කර ගැනීමටත්, භාණ්ඩ රැස් කරමින් ඒවා බෙදාහැරීම සඳහාත් කටයුතු කළහ.

"ශ්‍රමයෙහි ඉතා උසස් වනුයේ කුමක් දැයි නබි මුහම්මද් (සල්) තුමාගෙන් විමසුව ලදුව එතුමා පැවසුවේ ඇඟපත මහන්සියෙන් කරන රැකියාව සහ අවංක වෙළඳාම බවය'' (අහ්මද්). ඉහත හදීස් නම් මුහම්මද් නබි (සල්) තුමාගේ ප්‍රකාශය මගින් වැටහෙනුයේ වෙළඳාම ඉස්ලාමීය සමාජයේ උසස් ස්ථානයක් අත් පත්කර ගැනීමෙහිලා මහත් රුකුලක් වී ඇති බවය. නමුත් ඉස්ලාම් දහම බිහි වීමට ප්‍රථමව අරාබිවරු ලංකාව සමග සබඳතා පවත්වා ඇති බව ඉතිහාසය පෙන්වා දෙයි. අල් කියාබාකරී යන ග්‍රන්ථය සාධක කරගනිමින් සිද්දි ලෙබ්බෙ මහතා ඉදිරිපත් කරන වහාබ් ඉබ්නු හබ්සා සහාබි වරයාගේ ( නබි මුහම්මද් තුමා විසින් එවන ලද දූතයාගේ) තොරතුරු එයට නිදසුනකි.

ක්‍රිස්තු වර්ෂ නව වන සියවසේදී පමණ එවක දේශීය පාලකයන්ගේ අනුග්‍රහය ද ඇතිව ඔවුන් විශාල වශයෙන් මුහුදුබඩ පෙදෙස්වල ජනාවාස ගත වී සිටි බවට සාධක පවතී. හිටපු පුරාවිද්‍යාඥ ආචාර්ය බාලේන්ද්‍ර මහතා පවසන අයුරින් අරාබි වැසියන්ට වසර 2000 ටත් එහා වූ ඉතිහාසයක් මෙම ලක් දෙරණ සමග ඇති බව පැවසේ (අමීන්, 2000). ඒ බව සනාථ කිරීමට ශත වර්ෂ 3 කටත් පෙර රචිත ක්ලෝඩියස් ටොලමිගේ ක්‍රිස්තු වර්ෂ 150ක් පැරණි භූගෝලීය ශාස්ත්‍රීය සිතියමක් පාදක කර ගනිමින් අරාබි වරුන්ගේ නදිය යන අර්ථයෙන් "සෝන ෆුලුවියස්" යනුවෙන් අරාබිවරුන් දැදුරුඔය නම් කර තිබීම පෙන්වා දිය හැකිය (අමීන්, 2000). තවද විලියම් ගයිගර් සහ ප්‍රසිද්ධ ලේඛකයකු වූ පිලිනි ද මේ හා සමාන තවත් අදහස් දක්වා ඇත. ඒවා මගින් ද මුස්ලිම්වරුන් මෙරට සමග ඇතිකරගත් ඉපැරණි සබඳතා මැනවින් වැටහේ. ඒත් සමගම ඉස්ලාම් දහමේ පහළවීමත් සමඟම ඉස්ලාමීය ධජය යටතේ ඔවුන් හික්මුණු වෙළඳ ගතිගුණ සමග ඒ සඳහා ඔවුන් කටයුතු කළහ. ගිවිසුම් හරියාකාරව ඉටු කිරීම, යහපත් වූ හා අනුමත දේ පමණක් වෙළඳාම් කිරීම(හලාල් ද්‍රව්‍ය), භාණ්ඩ නොසැඟවීම, බාල භාණ්ඩ රවටා නොදීම, සොරකම් කරන දෑ මිලට නොගැනීම හා නොවිකිණීම, දුගියා හා ධනවතා අතර අසාමාන්‍ය ලෙස ධනය රැස් වන පරිදි ගිනි පොලී ගනුදෙනු තහනම් කිරීම වැනි වෙළඳාම පිළිබඳව ඉස්ලාමීය දහම තුළ විධික්‍රමයන් හඳුන්වා දී තිබේ. ඒවා බොහෝ සේ ව්‍යාපාරවල සාධාරණත්වයක් ඉසිලීමෙහිලා වැදගත් විය. ඒවාට පැහැදුණු ඉස්ලාමීය නොවන ජනයා අරාබිවරු සමග සමීප හා ශක්තිමත් සබඳතා ආරම්භ කළහ. එයට හොඳම නිදසුන නම් පණ්ඩුකාභය රජ සමයේ (ක්‍රිස්තු පූර්ව 377-307) තම අගනුවර වූ අනුරාධපුරයේ යම් ඉඩම් ප්‍රමාණයක් අරාබි වෙළෙන්දන් සඳහා වෙන් කිරීමයි (ලෝනා දේවරාජ, 1994 ).

ඒත් සමගම පෘතුගීසීන් මෙහි පැමිණෙන විට පුත්තලම, හලාවත, මාදම්පේ, මීගමුව, කොළඹ, කලුතර, බේරුවල, මග්ගොන, පයාගල, අලුත්ගම, බෙන්තොට, ගාල්ල, වැලිගම, මාතර යන ප්‍රදේශවල මුස්ලිම් ජනාවාස තිබූ බවට පෘතුගීසීන් විසින් ලේඛනගත කොට ඇති ඓතිහාසික වාර්තාවල අඩංගු ය (ෂුක්රි, 1986). තවද එවක ලංකාණ්ඩුවේ අග්‍ර විනිශ්චකාර වූ ශ්‍රීමත් ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් මහතා ද ඒ බව සනාථ කර ඇත (ලෝනා දේවරාජ, 1994 ). ෆර්නාඕ ද ක්වේරෝස් පියතුමාගේ ප්‍රකාශයක ද මේ පිළිබඳ විස්තර සඳහන් ය (ලෝනා දේවරාජ, 1994 ). එවක මුස්ලිම්වරු සතුව පාරම්පරික ව්‍යාපාරික දක්ෂතා, අන්තර්ජාතික සබඳතා, ඊට සම්බන්ධිත සියලු තාක්ෂණික දක්ෂතා නිසාම කෘෂිකාර්මික සමාජයක අවශ්‍යතා සැපිරීමේ දී ඔවුන් සාර්ථකව සමත් වූ බව එමර්සන් ටෙනන්ට් මුස්ලිම්වරු දෙස බලා ඉදිරිපත් කළ ප්‍රකාශය මෙසේ දැක්වේ. "ඔවුහු ස්වර්ණාභරණ වෙළෙන්දෝ වූහ, මැණික් තක්සේරුකරුවන් වූහ, මුතු රැස්කරන්නන් වූහ, රට අභ්‍යන්තරයේ ගම්මාන වල හා කැලෑබදව වාසය කළ තෘප්තිමත්, උදාසීන සිංහලයන් තම කුඹුරු ගොවිතැන් කිරීමට සිය ජීවිත කාලය ඔවුන්ගේ විහාර පන්සල් වල උත්කර්ෂවත් උත්සව පැවැත්වීම හැරුණු කොට කිසිදු විනෝදයක නොයෙදෙමින් තම දිවිය ගෙන ගියහ. නමුත් මුහුදුබඩ ක්‍රියාශීලී මහමදිකයන් වරායන්වල ගබඩා ඉදිකර ගනිමින්, තම නැව් හා වරායන් භාණ්ඩ වලින් පුරවමින් දිවයිනේ ධාන්‍යය සහ සුබෝපභෝගී භාණ්ඩ ද අගනා මැණික් ද දැව වර්ගද කුළුබඩු සහ ඇත්දළ ද චීනයට හා පර්සියානු බොක්කට යැවීමට එකතු කළහ.'' එකල මුස්ලිම්වරුන් සතු ව්‍යාපාරික කුසලතා මෙම ප්‍රකාශය මගින් අවබෝධ කරගත හැකිය. ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ සහ වරාය තුළ වෙළඳාමෙහි මුස්ලිම්වරු ඒකාධිකාරිය රඳවාගෙන තබාගෙන සිටියහ. පෘතුගීසීන් විසින් පෘතුගාල රජු දුන් ආඥාව අතැතිව 1518 දී ලෝපේ ද සොරොස් ද ඇල්බගේරියා ලංකාවට පැමිණ ශ්‍රී ලංකාවේ බලකොටුවක් ඉදි කිරීමට කටයුතු කළ අවස්ථාවේ මුස්ලිම්වරු තදින්ම එයට විරෝධය දක්වා රජුට බල කිරීමම ඔවුන්ගේ මෙරට වෙළඳාමහි ඒකාධිකාරියක් තිබූ බවත් ඔවුන් එවක බලවත් සමූහයක්ම සිටි බවටත් නිදසුනකි. ඕලන්ද ජාතික රයික්ලෙෆ් වැන් ගොයන්ස් (1663-1675) මුස්ලිම්වරු පිළිබඳ තැබූ සටහනක් වන " දිවයිනේ මුස්ලිම්වරු අප වෙළඳ සමාගමේ ලාභයට පිළිලයක්" යන ප්‍රකාශයෙන් ද මුස්ලිම්වරුන්ගේ එවක වෙළඳාමේ තිබූ ඒකාධිකාරිය කොතරම් ද යන වග වටහා ගත. මේ ආකාරයට වෙළඳාමෙහි ද,

කර්මාන්තවල ද වෙළඳාමට වාසි ගෙන දෙන රජුගේ ආර්ථිකමය උපදේශකවරුන් හා දූත මෙහෙවරයන්හි ද මුස්ලිම්වරුන් නිරත විය (ආෂිෆ් හුසෙයින්, 2018).

### *5.1 ශ්‍රී ලාංකීය නිෂ්පාදන ජාත්‍යන්තරයට හඳුන්වා දී දිවයින ලොව ප්‍රසිද්ධ කිරීම*

බටහිර ජාතීන් ආසියානු කලාපයට පැමිණීමට පෙර ම අරාබි ජාතීන් මෙම කලාපයට ඇතුළු වී වාණිජ කටයුතු ආරම්භ කළහ. පෙරදිග වෙළෙඳ භාණ්ඩ බටහිර දේශයන් වල අලෙවි කිරීමෙන් පෙරදිග පිළිබඳ ප්‍රසිද්ධත්වයක් ඔවුන් බටහිර දේශයන් වල ඇති කළහ. එතුළින් ලංකා දේශයට බටහිර ජාතීන් පැමිණීමටත් පෙරම බටහිර දේශයන් වල ලංකාව ප්‍රසිද්ධ විය. සෙයිලාන්, තැප්‍රොබේන්, සෙරන්ඩිබ්, සහිලාන්, සරණ්දිප් යන නම්වලින් ලංකාව ලොව තුල ප්‍රසිද්ධ විය (අසීස්, 2007). නමවන සහ දහවන ශතවර්ෂවල හෝ ආසන්න කාල වල මුස්ලිම් ලේඛකයන් ශ්‍රී ලංකාව පිළිබඳ බොහෝ තැන්වල සඳහන් කර තැබීම දැකගත හැක. ඔවුන් අතර සුලෙයිමාන් තර්, ඉබන් ෂරියර්, ඉබන් මසූදී මෙන්ම දේශාටන වාර්තා කරුවන් වූ ඉබන් බතූතා හා අල් ඉද්රීස් යන අයද වෙති. එම ලේඛකයන් විසින් මෙරට ඇත්දළ, කුළුබඩු, දැව වර්ග, කිතුල් පැණි, ඖෂධ, යකඩ, රතුකැට ප්‍රමුඛ මැණික් හා නානාවිධ ද්‍රව්‍ය සඳහන් කර ඇත. තවද නවවන සියවස හෝ ඊට ආසන්නව ශ්‍රී පාදස්ථානය අරාබිවරු ආදම් ස්වර්ගයේ සිට මෙලොවට පිටුවහල් කිරීම හා බැඳුන සිදුවීම පෙරටු කරගෙන ආදම් මෙලොවට මුලින්ම පාදය තැබූ ස්ථානය ලෙස ශ්‍රීපාදය හැඳින්වීමට පටන් ගෙන එය “ආදම්ගේ කන්ද“ නමින් නම් කළහ. පසුව එයට ගරු බුහුමන් දක්වමින් වන්දනා කටයුතු ආරම්භ කළ බව ඉතිහාසයේ සඳහන්ය (ලෝර්නා දේවරාජ, 1994 ).

ශ්‍රී ලංකාවේ විසූ ෂේක් සිරාසි යන අයෙක් මස්ජිදයක වාසය කරමින් ආදම්ගේ කන්දට වන්දනාවේ යන බැතිමතුන්ට මග පෙන්වූ බව ඉබන් බතූතා තම සටහනක දක්වා ඇත (ෂුක්රි, 1986). තවද ක්‍රිස්තු වර්ෂ 929 දී සමනළ ගිරට මඟ හෙළි කළ ප්‍රථම මුස්ලිම් වන්දනාකරුවා වූයේ ෂෙයික් අබ්දුල්ලා බාෆීන් යන අයෙකු යැයිද ඉබන් බතූතා සඳහන් කරයි (ෂුක්රි, 1986). මෙලෙස ආදම්ගේ කන්ද පිළිබඳ වූ ප්‍රවෘත්තිය අරාබිවරු ලොව පුරා ප්‍රචාරය කිරීම මගින් අරාබිවරු එය දැකබලා ගැනීමට ලංකාවට පැමිණි අතර ඒ අතරතුර ආපසු යන ගමනේදී සබරගමුව පළාතේ වූ මැණික් ද රැගෙන යාමට කටයුතු කර ඇති බව නිගමනය කළ හැක. ක්‍රිස්තුවර්ෂ 850 දී ශ්‍රී ලංකාවේ සංචාරය කළ අරාබි වෙළෙන්දෙකු මෙන්ම දේශ ගවේෂකයෙකු වූ සුලෙයිමාන් ශ්‍රී පාදස්ථානයට ගිය ගමනක් පිලිබඳව විස්තර කරන අතරතුර පවසන්නේ මෙලෙස රට අභ්‍යන්තරයේ සිටි සිංහල ජනතාව අරාබිවරු පැමිණි මුල් අවධියේ දී ඔවුන්ට යහපත් ප්‍රතිචාරයක් නොදැක්වූ බවත් පසුව අරාබිවරුන්ගේ භක්තිය, දැහැමි බව හා ඇදහීමේ අස්වාභාවික බලයක් පෙන්වීමේ ඔවුන්ගේ හැකියාව නිසා සිංහලයන්ගේ සිත් සතන් අරාබිවරු කෙරෙහි පැහැදුණු බවය. ඉන් කියවෙන්නේ ඔවුන් සමග යහපත් සබඳතා පැවැත්වූ බවත් ය (ලෝර්නා දේවරාජ, 1994). අරාබිවරුන්ගේ මුඛ්‍ය පරමාර්ථය වෙළඳාම බැවින් ඔවුන් දේශීය ජනතාව සමග ගනුදෙනු යහමින් සිදුකළ බව එයින් නිගමනය කළ හැක.

දොළොස්වන සියවසේ අග භාගයේ දී ශ්‍රී ලංකාවේ කුළුබඩු නිෂ්පාදනය හා අපනයනය මොරොක්කෝ මුස්ලිම්වරු විසින් වැඩි දියුණු කර ඇති බවත් එයින් වෙළඳාමට සහභාගිවීමට සිංහල රාජධානිවලට අවස්ථාවක් උදා විය (අබ්දුර් රහීම්, 1990 ). ඒ නිරිතදිග ඇති නව රාජධානිවල ලෝකයේ අති විශිෂ්ට ලෙස සලකනු ලැබූ කුරුඳු සුලභව ලැබුන බැවිනි. ඒත් සමගම දොළොස්වන සහ දහතුන් වන සියවස් වලදී අලෙවි කළ හැකි සියලු නිෂ්පාදන අපනයනය සඳහා එක්රැස් කිරීම පිණිස මුස්ලිම්වරු දිවයින පුරාම නියෝජිතයන් හා උප නියෝජිතයින් පත්කර තිබූ බව ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් පවසයි (ලෝර්නා දේවරාජ, 1994). ශ්‍රී ලංකාව සමුද්‍ර කේන්ද්‍රීයව ප්‍රධාන මධ්‍යස්ථානයක් ව පැවතීම හා එහි ප්‍රධාන වරායන් හා ත්‍රිකුණාමලය වරාය වැනි ස්වභාවික වරායන් පැවතීම ලොව පුරා ප්‍රචාරය වූයේ අරාබිවරුන්ගෙන් යැයි

සිතීම සාධාරණය. මන්ද එවක බටහිර හා පෙරදිග අතර අතරමැදියන් සේ වාණිජ කටයුතු සිදු කළේ ප්‍රධාන වශයෙන් අරාබිවරුන් වූ බැවිනි.

### *5.2 වෙළඳාම හා නිශ්පාදන ආර්ථිකය දියුණු කිරීම*

ශ්‍රී ලංකාව වාණිජමය අතින් සුවිශේෂී වූ කේන්ද්‍රස්ථානයකි. එය වෙළඳාම් කිරීමේ දී නාවික මධ්‍යස්ථානයක්, තවත් විටෙක ගබඩාවක්, තවත් විටෙක ආර්ථික භාණ්ඩ නිෂ්පාදනය කරන භූමියක් සේ ස්ථාපිත ව තිබිණි. මෙහි වූ නිෂ්පාදන ආර්ථිකය වූ කලී ස්වභාව ධර්මයෙන්ම ලැබෙන සම්පත් මෙම දේශය තුළම විය. මැණික් යනු එවන් වූ විශාල සම්පතකි. මෙරට මැණික් වල සුවිශේෂීතාවය පිළිබඳව අරාබි නිසොල්ලාසය වැනි කතාන්දරවල වල පවා සඳහන්ව තිබීම මෙරට මැණික් වල ප්‍රසිද්ධ බව විදහා දැක්වීම කෙතරම්දැයි පෙන්වාදීමට අපූරු නිදසුනකි. මාර්කෝ පෝලෝ මෙරට මැණික් පිළිබඳව මෙසේ පවසයි (ලෝනා දේවරාජ, 1994 ). “වෙනත් කිසිදු රටක දක්නට නොලැබෙන රතු මැණික් කැට මෙම දිවයිනේ පවතී. තවද නිල් මැනික්, පුෂ්පරාග, අඹතේස්ත, රබහ සහ වෙනත් මැණික් වර්ග මෙහි ඇති අතර ලෝකයේ ඇති අගනාම රතු කැටය මෙම දේශයේ රජු ළඟ ඇති බව ඔබට දිවුරා කියමි“ මේ ආකාරයේ වූ ධන සම්පත් ඇති සබරගමුවට අරාබිවරු නිසැකයෙන්ම යොමුවිය. මුහුදුබඩ පෙදෙස්වල මුල්කාලීනව දිවිගෙවූ ඔවුන් සබරගමුව වැනි රට අභ්‍යන්තරයට පැමිණීමට බොහෝ කල් ගත විය. මැණික් බහුල පෙදෙස් සබරගමු ආශ්‍රිතව තිබීමත් දේශ ගවේෂක සුලෙයිමාන්ගේ මුස්ලිම්වරු ආදම්ගේ කන්ද වන්දනාවට පැමිණිවිට සිංහල ජනතාවගේ ප්‍රතිචාරය පිළිබඳ ප්‍රකාශයත් සැලකීමේදී මොවුන් මැණික් වෙළඳාමට යොමුවූයේ දිවයිනට පැමිණ කලක් ගතවූ පසුයි යන්න නිගමනය කළ හැකිය. නමුත් ඇතැම් විද්වතුන්ගේ මත සැලකීමේදී අරාබිවරු ශ්‍රී ලංකාවට පැමිණීමට පෙළඹුණේම මැණික් සෙවීමේ උවමනාව මත යැයි පැවසේ. ඔවුන් මැණික් හඳුනා ගැනීම, කැපීම හා විකිණීම පරම්පරා ගණනාවක් මුළුල්ලේ ලබා ඇති පලපුරුද්ද බව “ඔවුන් අතර වෙළෙන්දන්, මුදල් හුවමාරු කරන්නන්, ස්වර්ණාභරණ කරුවන්, වඩුවන්, ඇඳුම් මසන්නන් සහ සියලු ආකාරයේ කාර්යයන් දැකගත හැක. මැණික් ගල් කැපීමේදි හා වෙනත් රත්රන් ආභරණ සෑදීමේදී ඔවුහු විශේෂ දක්ෂතා සහ සහජ හුරුවක් දක්වයි. ඔවුන් විසින්ම නිර්මාණය කරගත් සරල ක්‍රම භාවිතා කරමින් කර්මාන්තයේ හසල බුද්ධිය පෙන්නුම් කරන මෝස්තරවලින් යුත් දර්ශණීය ස්වර්ණාභරණ බොහෝ ප්‍රමාණයක් නිෂ්පාදනය කරයි. දිවයිනේ හමුවූ වටේට මැණික් අල්ලමින් සාදන ලද මුදුව ඔවුන්ගේ ප්‍රියතම ආභරණයකි“ යන ජේම්ස් කෝඩිනර්ගේ ප්‍රකාශයෙන් වටහා ගත හැකිය (ලෝනා දේවරාජ, 1994). තවද මේ ආකාරයේම රජුගේ ඒකාධිකාරියේ වූ මුතුපර කැඩීමේ කර්මාන්තයේ යෙදුණු කිමිදුම්කරුවන් මුළුමනින්ම පාහේ මුස්ලිම් හා ඉන්දියානුවන් වූ බව ලෝනා දේවරාජ විසින් සඳහන් කරයි. මාර්කෝ පෝලෝ විසින් සඳහන් කරන්නේ මුතුපර කඩා ලද ආදායමෙන් දහයෙන් පංගුවක් රජුට බදු වශයෙන් වෙළෙන්දන් ගෙවූ ද බවයි (ලෝනා දේවරාජ, 1994). රෙදි විවීම හා පේෂ කර්මාන්තයට මුස්ලිම්වරු දැක්වූ සහයෝගය ගැන සැලකීමේදි ඔවුන් එහි පුරෝගාමීන් වූ බවට සැලකිය හැක. ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් ගේ ප්‍රකාශයකට අනුව බේරුවල හොරකඩුව මුදලි මරික්කාර් නම් වෙළෙන්දෙකු රජුගේ කැමැත්ත පරිදි දකුණු ඉන්දියාවේ සාලියපට්ටනම් ගමෙන් රෙදි වියන්නියන් (සන්නාලියන්) සත් දෙනෙකු මෙරටට ගෙනවිත් ඇති බව පෙනේ (ආෂිෆ් හුසෙයින්, 2018). මේ බව ඔහු සනාථ කරනුයේ ඔහු සතුව ඇති තඹ සන්නසක විස්තරයක් ආශ්‍රයෙනි. ඒ තුළින් රටේ සලාගම යැයි කුලයක් ද බිහි වූ බව ඔහු පවසයි. මේ ආකාරයේ රෙදි විවීමේ කර්මාන්තය දායකත්වය දීම සම්බන්ධයෙන් ඔහුට හා ඔහුගේ පවුලට වරප්‍රසාද දුන් බවද සඳහන් වේ. තවද 1762 දී ජෝන් පයිබස් මහනුවරට ගිය ගමනේදී තෙවන රාත්‍රිය ගත කළේ ත්‍රිකුණාමලයට ආසන්න පගුරාණ නම් මුස්ලිම් ගමක බවත් එහි පදිංචි මුස්ලිම් පදිංචිකරුවන් සත්ව පාලනයට හා ගොවිතැනට අමතරව තමාගේ ඇඳුම් තමාම දළ කපු රෙදි කිහිපයකින් වියා ගැනීමට පුරුදුව සිටි බව පවසයි (ලෝනා දේවරාජ, 1994). තවද ඕලන්ද ජාතිකයන් තාවකාලිකව කොළඹ මුස්ලිම්වරුන්ට පදිංචිවීමට අවසර දුන්නේ ද ඔවුන්ට ඇඳුම් මැසීමට තිබූ හැකියාව

මත යැයි පැවසේ (ලෝනා දේවරාජ, 1994). මුස්ලිම්වරුන්ගේ රෙදි විවීමේ දක්ෂතාවයන් හා දේශයට සිදු වූ සේවාවන් මෙමගින් වටහා ගත හැක.

ඕලන්දවරු උඩරට රාජධානියට අයත් වරායන් යටත් කොට රාජධානිය හුදකලා කිරීමට ගත් උත්සාහයේදී පෙරියතම්බි මරික්කාර් තම වෙළෙඳ නැව් වලින් මන්නාරම, පුත්තලම ගංමෝය හා කලපු වලට හොරෙන් රිංගා උඩරැටියන්ගේ හා දේශීය මුස්ලිම්වරුන්ගේ භාණ්ඩවලට තම භාණ්ඩ හුවමාරු කළ බව පැවසේ. එය උඩරට රාජධානියේ රජු ප්‍රමුඛ වැසියන්ට උද්ගත වූ තත්ත්වය මත මහත් සහනයක් විය. රාජධානිය ගත කළ අසීරු කාල වලදීත් මුස්ලිම්වරු දැක්වූ සහයෝගයට මෙය කදිම නිදසුනකි. පෘතුගීසීන් හා යුධ වැදීමට සූදානම් වනු පිණිස සෙනරත් රජු විසින් මුස්ලිම්වරු විශාල වශයෙන් නැගෙනහිර ප්‍රදේශයේ පදිංචි කළහ. ඒ තුළින් එම ප්‍රදේශයේ වී වගාව වර්ධනය වූ අතර මඩකළපුවෙහි අතිරික්ත වී ගබඩා ඉදිකර අනෙක් පෙදෙස් වලටද වී යවනු ලැබීය. මහනුවර මිනිපේ සහ වෙල්ලස්ස හරහා මඩකලපුව දක්වා මාර්ගයක් ද බිහිවිය (අසීස්,2007). මෙමගින් පැහැදිලි වන්නේ මුස්ලිම්වරුන් එවක රාජධානියේ සහල් අවශ්‍යතා සැපිරූ අතර එය යුද කටයුතු සඳහා අඛණ්ඩව ආහාර සැපයුමක් ලෙසින් ද දායක වූ බවයි.

එවක වෛද්‍ය කටයුතු සඳහා අවශ්‍ය බෙහෙත් වර්ග ද අරාබි ජාතිකයන් මෙරටට ආනයනය කළ තොරතුරක් පිළිබඳව යුනෙස්කෝ සංස්කෘතික ත්‍රිකෝණය ව්‍යාපෘතිය ඔස්සේ කරන ලද කැණීමකදී තහවුරු විය (ලෝනා දේවරාජ, 1994). එනම් අනුරාධපුර මිහින්තලේ පුරාණ රෝහල් භූමිය කැණීමකදී දළ වශයෙන් හත්වන සියවසේ සිට නම වන සියවස දක්වා කාලයට අයත් සැසේනියානු ඉස්ලාමීය අවධියේ ප්‍රසිද්ධ බුජම් හමු වී තිබීමයි. ඉන්දියානු වෙරළබඩ ප්‍රදේශවලද මෙලෙස බුජම් කැබලි හමු වී ඇත. ඒවා විශාල තොග ලෙස දිවයිනට ආනයනය කර ඇති මැටියෙන් තැනූ බුජම්ය. මිහින්තලා රෝහලට ඖෂධ ගෙන එන ලද්දේ හෝ ඖෂධ තැන්පත් කිරීමට භාවිතා කරන ලද්දේ මේ බුජම් විය හැකි බව පුරාවිද්‍යාඥයින් පවසයි (ලෝනා දේවරාජ, 1994). වෙළඳ සම්බන්ධකම් පැවැති පොළොන්නරු යුගයට අයත් පෙදෙස් වල තවත් මෙවැනි පිඟන් ගඩොලෙන් තැනූ මැදපෙරදිග බුජම් වල කැබලි තැනින් තැන කැණීම්වලදී හමුවී ඇත. ඖෂධ ආනයනය හා දේශීයයන්ගේ සෞඛ්‍යය යහපත් අයුරින් පවත්වා ගැනීමට මෙම ආනයනය මහත් සේ ප්‍රයෝජනවත් වූ බව එමගින් නිගමනය කළ හැකිය.

කුරුඳු වගා කිරීම, ඒවා පදම් කිරීම සම්බන්ධව ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් මෙසේ කරුණු දක්වයි. “ලංකාවේ නිරිතදිග වෙරළබඩ ප්‍රදේශවල කුරුඳු සාමාන්‍යයෙන් වගා කරයි. මෙලෙස වෙරළබඩ ප්‍රදේශවල කුරුඳු වගා කිරීම හා පදම් කිරීම සිදුකරනුයේ මුස්ලිම් වරුන්ය. ඔවුන් එහි 24000ක් හෝ 25000ක අතර ප්‍රමාණයක් වෙති (ෂුක්රි, 1986).“ මෙතුළින් කුළු බඩු වෙළඳාමට අමතරව කුළුබඩු වර්ග නිෂ්පාදනය සහ වෙළඳාම පිණිස ද්‍රව්‍ය සකස් කිරීමටද මුස්ලිම්වරුන් කටයුතු කළ බව පෙනේ.

තවද ලාංකීය මුස්ලිම්වරුන් නැගෙනහිර පළාතේ වී, අවරිය වැනි ධාන්‍ය වර්ග ත්‍රිකුණාමලය වරායෙන්, රතු සායම් වර්ග සහ පරාල ලෙස භාවිතා කරන කළු තල් දැව ද හක්ගෙඩි යාපනයනුත්, මුතු කුදිරමලෙන් ද පුවක්, බුලත්, කලුවර දැව, බුරුත දැව, කළුමැදිරිය දැව සහ සායම් නිපදවන සම්පන් ලී පුත්තලමෙනුත්, කුරුඳු, කොළඹිනුත් පොල් තෙල් හා පොල් කොහු බේරුවලිනුත් ඇත්දල සහ අනෙකුත් ඇතුන් ගාල්ලේන් එකතු කරගන්නා බවත් එම අගනා නිෂ්පාදන මන්නාරමේ සහ මාන්තොට ඉදිකරනු දැවැන්ත ගුදම් වල ගබඩා කර අපනයනය කරන බවත් ලෝනා දේවරාජ (1994) යන්ගේ කෘතියක සඳහන් කර ඇත. මේ ආකාරයට වෙළඳාමේ අරමුණින් පැමිණි මුස්ලිම්වරු ඔවුන්ගේ අභිලාෂයන් ද ඉටුකරගනිමින් දේශයේ නිෂ්පාදන පිටරට අපනයනය කරමින් දේශීය වෙළඳාම සහ නිෂ්පාදන ආර්ථිකය දියුණු කිරීමට ධනය මෙරටට ගෙන ඒමෙහිලා මහත් කැපවීම් කළ බව මෙමගින් නිගමනය කළ හැක.

### *5.3 රජු ප්‍රමුඛ රදල සමූහයට සිය දේශපාලන කර්තව්‍යයේ දී ආර්ථිකමය වශයෙන් ශක්තියක් වීම*

දේශපාලනය යනු මහජනතාව ප්‍රමුඛ රාජ්‍ය පාලනය කිරීමයි. මහජනතාව පාලනය කිරීමේ දී වැදගත් වනුයේ මහජන සුබසිද්ධිය සැලසෙන සේ රාජ්‍ය පාලනය කිරීමයි. එහිදී මහජනතාව ආර්ථිකමය අතින් ස්වයංපෝෂිත කිරීමත් දේශයේ ආර්ථිකය නඟාසිටුවීමත් පාලකයා සතු කාර්යයකි. ශ්‍රී ලංකාවේ අතීත රජ දවස රට ස්වයංපෝෂිත කිරීමේදී මුස්ලිම්වරුන් විසින් දැක්වූ ආර්ථිකමය උපකාර අති විශාල වශයෙන් දේශීය නිෂ්පාදන අපනයනය කිරීමටත් ඉන් රටට ධනය ගෙන එන මාර්ග සැකසීමටත් තවත් විටෙක විවිධ ආනයනය මගින් ස්වදේශික ජනතාවට වෙළඳ සේවා සැපයීමේ කාර්යයන්වල නිරත වීමටත් දායක විය. කෙසේ නමුත් එය සිදුවූයේ රජවරුන්ගේ හා රදලවරුන්ගේ අනුග්‍රහය මතයි. රජු ප්‍රමුඛ රාජ සභාවට ද අවශ්‍ය වූයේ රට ආර්ථික වශයෙන් ස්වයංපෝෂණය කිරීමේ අධිෂ්ඨානයයි.

13වන සියවසේ බාහිර ලෝකයේ පැනනැගුණු එකිනෙක සිද්ධි ගණනාවක් ශ්‍රී ලංකාව කෙරෙහි ද බලපෑ අතරම ඒවා අතුරින් දකුණු ඉන්දීය ආක්‍රමණ ලංකාවට බලපෑ ප්‍රධාන බලපෑමකි. එමගින් සිදු වූයේ සිංහල රාජධානිය ක්‍රමක්‍රමයෙන් නිරිත දිගට සංක්‍රමණය වීමයි. මේ අතරම යාපනය රාජ්‍යය ද කුළුබඩු වෙළඳාමේ නිරත වීම නිසා සිංහල රාජධානියට වෙළඳාමේදී තරගයක් ඇති විය. නමුත් සිංහල රාජධානිය තුළ වෙළඳාම සම්පූර්ණයෙන් මුස්ලිම්වරු අතෙහි රැඳී තිබීම නිසා සිංහල පාලකයන්ට එම ආක්‍රමණවලට මුහුණ දීමට පහසු විය. මන්ද මුස්ලිම්වරු සිංහල පාලකයන්ට පක්ෂව ඔවුන්ට ආර්ථිකමය ශක්තියක් වූ බැවිනි. එහිදී සිංහල පාලකයන් වැඩි වැඩියෙන් මුස්ලිම්වරුන්ට ගැති විය. එච් ඩබ් කොඩ්රිංටන් පවසන පරිදි ආක්‍රමණ හා වෙළඳාම කෙරෙහි වූ තරගයක් වැනි අභියෝග වලදී 1283දී යාපහුව රාජධානියේ පළමුවන බුවනෙකබාහු රජු සමඟ මුස්ලිම්වරුන්ගේ උපදේශය හා සහයෝගය සමඟින් ඊජිප්තුව සමග වෙළඳ හා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ආරම්භ කළහ. ඒ අනුව බුවනෙකබාහු රජු විසින් අල්හාජ් අබූ උස්මාන් යන අයගේ නායකත්වයෙන් ඊජිප්තුවේ මම්ලූක් රාජ සභාවට තානාපති පිරිසක් යැවූහ (ෂුක්රි, 1986). එයින් බැග්ඩැඩය අභිබවා නැගී තිබුණු ඊජිප්තුව සමඟ සෘජු සබඳතා ඇති කරගැනීම නිසා පහළ වැටෙමින් තිබූ රටේ ආර්ථිකය ප්‍රකෘතිමත් කරගැනීමට හැකිවිය. මේ පිළිබඳව රජුගේ ලිපියක දැක්වෙන්නේ සිංහල රාජ සභාවේ ක්‍රියාත්මක වුන බලගතු මුස්ලිම් කණ්ඩායමකගේ වැයමක ප්‍රතිඵලයක් ලෙස මෙම වෙළෙඳ දූත මෙහෙවර සාර්ථක වූ බව ය. තවද කොළඹ හා මහනුවර අතර කයිරෝ බහ්රි මම්ලූක්වරුන්ට අයත් කාසි හමු වීම මගින් මේ පුවතේ සත්‍යතාව මැනැවින් වටහාගත හැකිය (ලෝනා දේවරාජ, 1994). මුස්ලිම් වරුන් සතුව තිබූ පක්ෂපාතීත්වය, අන්තර්ජාතික සබඳතා, මුහුදු යාත්‍රා කිරීමේ දක්ෂතා නිසා මෙවැනි ආර්ථික වාසි ලංකා දේශයට ලැබූ බව පැවසිය හැක. තවද පෙර ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් පැවසූ කරුණක් වූ දකුණු ඉන්දියාවේ සාලියපට්ටනම් ගම්මානයෙන් රෙදි වියන්නන් ලංකාවට ගෙනවිත් රෙදි විවීමේ කර්මාන්තය ලංකාවේ ආරම්භ කිරීම ද මෙවැනිම මුස්ලිම්වරුන්ගේ තවත් ආර්ථිකමය උපකාරයකි. 1344 දී ඉබන් බතූතා මෙහි පැමිණෙන විට සිංහල රාජධානියේ තිබුණු මත භේද වලින් යාපනයේ රජු වූ ආර්ය චක්‍රවර්ති මහත් ප්‍රයෝජන ලබා ගත් බව පැවසේ. මන්නාරම් බොක්කේ සිංහල රජුට අයත් මුතුපරයන්ගෙන් ඔහු තම රාජධානියේ භාණ්ඩාගාරය තර කර ගන්නා ලදී. මාර්කො පෝලෝ පවසන්නේ එවක මෙම මන්නාරම බොක්ක අශ්‍රිත මුතුවලට ලෝකයේ සිව්දිගින් ඉල්ලුමක් තිබූ බවයි. නමුත් මුස්ලිම්වරුන් ද මෙම වෙළඳාමෙන් නිරත වූ නිසා රජුට එය රැක ගැනීමෙහිලා විශාල අස්වැසිල්ලක් විය. මාර්කො පෝලෝ පවසන්නේ මුතු ආදායමෙන් දහයෙන් පංගුවක් රජුට ඔවුන් ගෙවූ බවයි. (ලෝනා දේවරාජ, 1994)

අරාබි වෙළෙඳපොළ කෙරෙහි සිංහල හා ද්‍රවිඩ පාලකයන් අතර තරගයක් තිබිණි (1357-1374) (රාමනාදන්, 1888). තුන්වන විජයබාහුගේ කාලයේ ආර්යචක්‍රවර්ති මීගමුවට හා කොළඹට පහරදුන් බවත් එහි යම් පාලනයක් ගෙන ගිය බවත් පැවසේ. මේ වන විට කොළඹ මුස්ලිම් වාණිජ කටයුතු සමෘද්ධිමත්ව තිබූ බව ඉබන් බතූතා පවසයි (ලෝනා දේවරාජ, 1994). මුස්ලිම්වරු සිංහල රජවරුන්ට අවශ්‍ය නාවුක

සහයත් හමුදා සේවා ලෙස හේවායන් ලෙසත් සහය විය. පෝලෝ විසින් පවසන පරිදි 1292 අවධියේදී ලාංකිකයන්ට හේවායන් අවශ්‍ය වූ විටෙක "සරසන්වරු" බඳවා ගත් බවත් ඉන් පළමු සහ දෙවන වර දකුණු ඉන්දීය ආක්‍රමණ සැහෙන ලෙස සාර්ථකව මැඩ පැවැත් වූ බවත් පැවසේ. 1360 - 1370 කාලයේ දකුණු ඉන්දීය විජය නගර් බලය පැතිරීමත්, කෝට්ටේ 4 වන පරාක්‍රමබාහු රජ යටතේ තහවුරු වීමත් නිසා ආර්ය චක්‍රවර්තීට පසු බැසීමට සිදු වූ බවත් ඉන් ලැබූ වෙළඳ ජයග්‍රහණයන්ගේ ප්‍රතිඵල ලෙස මුළුමනින්ම වෙළඳාම මුස්ලිම්වරු සතු විය (අබ්දුර් රහීම්, 1990). එයින් සිංහල රාජධානියේ ආර්ථිකයට වාසිදායක විය.

විජයබා කොල්ලයේ ප්‍රතිඵල ලෙස කෝට්ටේ රාජධානිය තුනට බෙදුණු පසු සහෝදරයන් අතර වූ ආරවුල් ඇති වී දී සීතාවක මායාදුන්නේට මුස්ලිම්වරු සහාය දුන්හ. එහිදී වරායවල් කිහිපයක් මුස්ලිම්වරුන්ට දීමට පොරොන්දු වූ විට මුස්ලිම්වරුන්ද ප්‍රතිඋපකාර ලෙස කැලිකට් සැමොරින්ගේ මුස්ලිම් සේනාවන් මෙරටට ගෙන්වා යුද වැදුණහ. මේ සිදුවීමට වක්‍රාකාරයෙන් පෘතුගීසීන් ද සම්බන්ධ බැවින් එමඟින් ආර්ථික ක්ෂේත්‍රයටද බලපෑම ඇති කළ හැකි විය. 1604 - 1625 වැනි වකවානුවේ සෙනරත් රජුගේ අණට යටත් වූ මුස්ලිම්වරු නැගෙනහිර වෙරළ ආසන්නව පදිංචි විම මගින් නැගෙනහිර ගොවිතැන නගා සිටුවීමට ශ්‍රමයෙන් උරදෙමින් වෙළඳ කටයුතු වලට ද සහාය දුන්හ (ෂුක්රි, 1986). ඒ අනුව රාජ්‍යය ගත කළ දුෂ්කර අවධිවල ආර්ථිකමය වශයෙන් මුස්ලිම්වරු රජුට සහාය දක්වා ඇත.

උඩරට රදළවරුන් වෙළඳාමෙන් නිරත නොවූ බැවින් ඒවා මුස්ලිම්වරුන් හට පැවරීය. නමුත් ඕලන්ද ඒකාධිකාරිය නිසා ඒවා නැවතුන අතර එහි ප්‍රතිඵල ලෙස රදළවරුන්ගේ වෙළඳ කටයුතු හා මූල්‍ය ආදායම් මාර්ග අහිමි විය. රජුට අයත් වරායන් වල තම අණසක පතුරුවා සිටි අවධිවල ඉඳහිට රජු සැනසීම පිණිස වසරකට වරක් රජුට අවශ්‍ය භාණ්ඩ මිලදීගෙන පැමිණීමට යාත්‍රාවලට අවසර දුන්හ. මෙයින් ප්‍රයෝජන ලැබූ රදළවරු වෙළෙඳ ද්‍රව්‍ය රැගෙන පුත්තලමෙන් පිටත්වීම සඳහා රජුගේ නමින් මුස්ලිම්වරුන්ගේ යාත්‍රාවලට අවසර දුන්හ (ලෝනා දේවරාජ, 1994). නමුත් සුපරික්ෂාකාරී වරුන්ගේ දියුණු බැල්මට හසු වූ වාර ද විය. කෙසේ නමුත් ඕලන්ද වරුන්ගේ වෙළඳ ඒකාධිකාරිය බිඳීමට මුස්ලිම්වරු උඩරට රදළවරු හා අත්වැල් බැඳ ගත් බවට මෙය කදිම නිදසුනකි. මේ ආකාරයටකාරයට රජුට හා රාජ්‍ය සභාවට රාජ්‍යතාන්ත්‍රික සබඳතා වර්ධනය කර ගනිමින් රටේ ආර්ථිකය නගා සිටුවීමටත් රදළවරුන්ගේ පුද්ගලික ආර්ථිකය නගා සිටුවීමටත් මුස්ලිම්වරු මහත් පරිශ්‍රමයක් දරා කටයුතු කර ඇති බව නිගමනය කළ හැක.

### *5.4 අනිවාර්ය රාජකාරී ක්‍රමයට අනුගත වෙමින් උඩරට රාජධානියට දැක්වූ දායකත්වය*

මුහුදුබඩ ප්‍රදේශවල කිතුනු බලවතුන් ගේ දැඩි මර්දනකාරී ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් මුස්ලිම්වරු වැඩි වශයෙන් රට අභ්‍යන්තරයට හෙවත් උඩරට රාජධානියට පිවිසිය. මුස්ලිම්වරුන්ට උඩරට රාජධානියේ සිංහල දේශීයකරණයකට ලක්වීමට එහිදී ඔවුන්ට සිදුවිය. නමුත් ඔවුන්ගේ ඉස්ලාමීය අනන්‍යතාවය ආරක්ෂා කර ගත්හ. එසේ දේශීයකරණයට හසුවී ඔවුන් ද උඩරට රාජධානිය සමෘද්ධිමත් කිරීමෙහිලා කැපවිය. එවක සෑම බද්දකටම විශේෂ දක්ෂතාවයකින් හෝ දේපළ වලින් බදු ගෙවිය යුතු බව උඩරට රාජධානියේ බදු ක්‍රමය විය. මුස්ලිම්වරුන් තවලම් මගින් වෙරළ බඩ ප්‍රදේශයට ද මසුන් මරන්නන්ට ද ලුණු හා කරවල වෙළඳාම සමඟ නිරන්තර සබඳතා පැවැත්වූ බැවින් ඔවුන්ද මඩිගේ බද්දට යටත්විය. තවද මුහන්දිරම්වරු හා ලේකම්වරු යටතේ සංවිධානය වී සිටි ගම්මානවල ජීවත්වන ඉඩම් නොමැති මුස්ලිම්වරු හුලං බද්ද මඩිගේට අයත්ව තිබූ බවටද සාධක පවතී.

තවද මුස්ලිම්වරුන්ගේ ගවයන් රජුගේ ඉඩම් වල උලා කෑ බැවින් රජුගේ හෝ මඩිගේ ප්‍රධානියාගේ හෝ කවර භාණ්ඩයක් වුවද ප්‍රවාහනය කිරීමට බදු ලෙස තවලම් සැපයිය යුතුය. අග්නිදිග ලුණු ලේවායන්ට ආසන්නව ජීවත් වූ ඌව මුස්ලිම්වරුන්ගේ අනිවාර්ය රාජකාරිය කොටසක් ලෙස රාජකීය ගබඩා වලට ලුණු සැපයී ය. මුස්ලිම්වරුන්ගේ විශේෂ දක්ෂතාවයන් වන වෙළඳාම රාජ්‍ය යහපත සඳහා යොදාගත්

අවස්ථා ඇත. ඒ රජුට අයත් වෙළෙඳාම් කිරීමට අවසර දී තිබීම නිසා රජු වෙනුවෙන්ද වෙළඳාමේ යෙදිය යුතු ලෙසයි. ලෝනා දේවරාජ (1994) පවසා ඇති පරිදි ඔවුන් රජුගේ ඒකාධිකාරියක් වූ පුවක් වෙලදාම මඩිගේ බද්දට යටත් කර තිබුණ නිසා ඔවුන්ට ගෙයින් ගෙට ගොස් පුවක් එකතු කිරීමට සිදුවිය. ඔවුන් ඒවා රුවන්වැල්ල ඕලන්ද දේශසීමාවට තවලම් මගින් ප්‍රවාහනය කර ලාභය භාණ්ඩාගාරයට යවයි. එවක මාලිගාවට අයත් ගම් මාලිගා ගම් ලෙසත්, විහාර වලට අයත් ගම් විහාරගම් ලෙසත්, දේවාලගම් වලට අයත් ගම් දේවාලගම් ලෙස හැඳින්වූහ. මුස්ලිම්වරු මෙම තුන් ආකාරයෙහිලා වූ ගම්දනව් වල අනිවාර්ය රාජකාරියේ යෙදුනහ.

1872හි සම්පාදිත මහනුවර දිස්ත්‍රික් බදු ලේඛනයේ මාලිගාවට අයත් සේවා පංගුවල මුස්ලිම්වරුන්ගේ නම් ද ඇතුළත් විය (අසීස්, 2007). ඒ අනුව පෙනී යන්නේ ඔවුන් උඩරට රාජධානියේ සේවා පංගු මගින් අනිවාර්ය රාජකාරිය ක්‍රමයට අනුගත වෙමින් රාජධානියේ ආර්ථිකයට දායක වූ බවයි. මෙහිදී මාලිගාවට අයත් ලුණු දෙන පංගුව, හේවිසි පංගුව( බෙර ගැසීමේ කාර්යය) ගෙවූ බව සඳහන්ය. තව බඩල් පංගුව නමින් ආචාරී හෙවත් ලෝකුරු කර්මාන්තයේ නියැලෙන මුස්ලිම්වරු මාලිගාවට අවශ්‍ය භාණ්ඩ සෑදීම ඔවුන්ගේ කාර්යය විය. තවද මාලිගාවේ වැදගත් රාජකාරියක් වූ කාරියකරවන රාළ ධුරයේද මුස්ලිම්වරු කටයුතු කර ඇති බව රාජකාරි බදු ලේඛනයේ සඳහන්ය. විහාර ගම් වල පදිංචිව සිටි මුස්ලිම්වරුන්ට පැවරූ රාජකාරිය ප්‍රධාන වශයෙන් තවලම ආශ්‍රිත රැකියාවන් ය. එනම් පැටවිලි පංගුවයි. එනම් කුඹුරේ සිට අටුව දක්වාත් අටුවේ සිට මුහුදුබඩ ප්‍රදේශ දක්වා ධාන්‍ය රැගෙන එහි සිට කරවල හා ලුණු සැපයීමත් ය. තවද විහාර ගම් වල පදිංචි කුලී නිවැසියන් ගේ රාජකාරි අතරට ධාන්‍ය ප්‍රවාහනය, විහාර භූමිය සුදු වැලි වලින් අලංකාර කිරීම, පොල් හා කරවල සැපයීම අඩංගු වූ බව ඒ ඒ විහාරවල රාජකාරි බදු ලේඛනවල සඳහන්ය (ලෝනා දේවරාජ, 1994). තවද දේවාලගම් වල ද අනිවාර්ය රාජකාරි පදනමට මුස්ලිම්වරු පදිංචිව සිටි බවට සාධක පවතී. නිදසුන් ලෙස ගඩලාදෙණිය විහාරයේ ලුණු දෙන පංගුවත් (වාර්ෂිකව ලුණු ලබා දීම) මුස්ලිම්වරුන් භුක්ති විඳි බව ඉතිහාසය පෙන්වා දෙයි. තවද ඇම්බැක්කේ දේවාලයට අයත් දොඩංගමුව ගම්මානයේ ද මුස්ලිම්වරුන් මෙම පදනම මත රාජකාරි කළ බවට සාධක ඇත. බ්‍රිතාන්‍ය ජාතික මයිකල් රොබට්ස් පවසන පරිදි "මුස්ලිම්වරුන්ට පැවරෙන රාජකාරි චාරිත්‍රානුකූල පදනමකින් නොව අනිවාර්ය රාජකාරි පදනමෙන් ම සිදු විය" බව පවසයි. තවද ජෝන් ඩේවි ද මුස්ලිම්වරු උඩරට රාජධානියට කළ සේවය පිළිබඳව පවසයි (ලෝනා දේවරාජ, 1994). ඒ අනුව අපට නිගමනයට පැමිණිය හැක්කේ ඔවුන් උඩරට රාජධානියේ ආර්ථික ක්‍රමය වන අනිවාර්ය රාජකාරිය ක්‍රමයට අනුගත වෙමින් ආර්ථිකයට දායක වූ බවයි.

### *5.5 ප්‍රවාහන, වාරි හා වරාය කටයුතුවලට දැක්වූ සහයෝගය*

ආර්ථිකයේ වර්ධනය හෝ පසුබෑසීම මත කරුණු විශාල ප්‍රමාණයක් බලපානු ලබයි. එහිදී සිදුවන වෙනස්වීම් ආර්ථිකය කෙරෙහි සෘජුව හෝ වක්‍රව බලපාන ලැබේ. ප්‍රවාහනය, වාරි පද්ධතිය එවැනි වූ සාධකය. තවද වරාය වැනි පහසුකම් ආර්ථික මර්මස්ථානයන් වේ. ඉතිහාසයේ මුස්ලිම්වරු ශ්‍රී ලාංකීය ආර්ථිකයට දැක්වූ දායකත්වය ගැන සැලකීමේදී ප්‍රවාහනය හා වරාය ක්ෂේත්‍ර වලට ද දක්වා ඇති සහයෝගය අතිමහත් ය. අනුරාධපුර යුගයේ සිට මාන්තොට යනු අරාබි වරුන්ට ප්‍රධාන වරායක් විය. එය අගනුවරට සම්බන්ධ කරමින් මහා මාර්ග සංවිධානය වී තිබිණි. මේවා මෙලෙස සංවිධානය වීමට වෙළඳාම හේතු වූ බව සැලකිය හැකිය. මන්නාරම් පුලියන්තිව්, පුත්තලම අනුරාධපුර මාර්ගයේ අසල පුත්තලම කුරුණෑගල මාර්ගය අසල හමුවූ මුස්ලිම් සොහොන් කොත් වල ඉදිකෙරෙනු නමවන සහ දහවන සියවසට අයත් අරාබි ශිලා ලේඛන වල එවක අරාබිවරුන් මෙම වරායට පැමිණි බවත් ඔවුන් වෙළඳාම සඳහා රට අභ්‍යන්තරයට ගිය බව සඳහන්ය.

මේ ආකාරයට ඔවුන් වෙළඳ කටයුතු ශ්‍රී ලංකාව සමග පවත්වමින් ලංකාවට ද ඉන් වාසි සහගත අයුරින් කටයුතු කළ බව ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් පවසයි. එනම් අරාබි වාණිජ සමෘද්ධිය පැවති සමයේ (450-473) ධාතුසේන රජු විසින් යෝධ වැව සම්පූර්ණයෙන් අලුත්වැඩියා කළ බවත් එමඟින් අවට කුඹුරුවලට ජලය සැපයූ බවත් සඳහන් වේ. මෙහිදී යෝධ වැව නිර්මාණය කිරීම සඳහා ආර්ථික ශක්තිය ලබා දුන්නේ අරාබීන් සතුන් විදේශ වෙළඳාමෙන් ලද ආදායමින් බව පැවසේ. මේ ආකාරයට ශ්‍රී ලංකාවේ විදෙස් වානිජ කටයුතු වර්ධනය වී පැවති වකවානුවේ විශාල ජල සම්පාදන වැඩ කටයුතු මෙහෙයවා ඇති බවත් විදෙස් වෙළෙඳාම මෙම ජල සම්පාදන කටයුතු වලට අවශ්‍ය ආදායම ලබා දුන් බවත් මහාචාර්ය ගුණවර්ධන මහතා පවසයි (ලෝනා දේවරාජ, 1994).

විජයබා කොල්ලයෙන් පසු සහෝදරවරු කෝට්ටේ රාජ්‍ය කුඩා රාජ්‍යයන් තුනකට බෙදා ගත් පසු මායාදුන්නේ රජුට බිය වූ බුවනෙකබාහු රජු පෘතුගීසි සහාය පැතුහ. එය ප්‍රයෝජනයට ගත් පෘතුගීසින් කොළඹ සිටින සියලු මුස්ලිම්වරුන්ව පලවා හරින ලෙස ඉල්ලීම් කළහ. ඒ තරමටම මුස්ලිම්වරුන් පෘතුගීසීන්ට තර්ජනයක් වීමෙන් වැටහෙනුයේ මුස්ලිම්වරු වරායන්වල වෙළඳාමේ ස්ථාවර සිටි බවයි. අනිවාර්ය රාජකාරි කටයුතුවලදී මුස්ලිම්වරුන්ට පවරා ඇත්තේ බොහෝ දුරට තවලම් ආශ්‍රිත පැටව්ලි පංගු ය (තවලම මගින් ප්‍රවාහනය). එයින් ඔවුන් වෙළඳාමේදී ප්‍රවාහන ක්ෂේත්‍රයේ දී ඉහළින් සිටි බව පැහැදිලි වේ. පුත්තලම,කල්පිටිය වරාය වල හත්කෝරළයට සම්බන්ධ වූ බවත් එහි නිෂ්පාදනයන් වූ ප්‍රධාන වශයෙන් පුවක් හා සහල් මුස්ලිම් වෙළෙන්දන් තවලම් මගින් කල්පිටියට ගෙනගොස් මදුරාපුරයෙන් හා තාන්ජෝරයේ සිට පැමිණෙන කල්පිටියේ නැංගුරම් දැමූ නවතා ඇති විශාල යාත්‍රා වලට එක්රැස් කරන බව ඉතිහාසයේ සඳහන්ය (ලෝනා දේවරාජ, 1994). මේ අනුව රටේ අභ්‍යන්තර නිෂ්පාදන අපනයනය කිරීමේදී මුස්ලිම්වරුන්ගේ තවලම විශාල ලෙස භාවිතා වූ බව පැවසේ. මේ ආකාරයට ප්‍රවාහනය, වරාය, වාරි ක්ෂේත්‍රයට මුස්ලිම්වරුන් දැක්වූ දායකත්වය රටේ ආර්ථික වර්ධනයන්හිදී වැදගත් විය.

## 6. නිගමන

ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන් අතීතයේ සිංහල රජ වරුන් විසින් ලංකාව පාලනය කරන අවධියේ ස්වදේශික නිශ්පාදන ලෝකයට හඳුන්වා දී ලාංකීය නාමයට කීර්තියක් අත් කර දී ඇත. තවද විවිධ ක්ෂෙත්‍රයන් ඔස්සේ දේශීය වෙළඳාම සහ නිශ්පාදන අංශ දියුණු කර ඇත. ආර්ථිකමය අතින් රාජ්‍යයේ දුශ්කරතාවයන් ඇති වූ අවධි වල දේශපාලන අංශ වලට උපකාරී වී ඇත. රාජ්‍ය තාන්ත්‍රික සබඳතා මගින් නව ආර්ථික අවස්ථා උත්පාදනයට දායක වී ඇත. දේශයේ ක්‍රියාත්මක වූ බදු ප්‍රතිපත්ති වලට යටත් වී රාජ්‍යයේ ආදායම් වලට සහය වී ඇත. ප්‍රවාහන, නාවුක, වාරි සහ වරාය ක්ෂේත්‍රයන් හි දියුණුවට දායක වී ඇත. සමස්ථයක් ලෙස ආර්ථිකයෙහිලා රාජ්‍යයට බලපෑම් කළ හැකි සහ ආර්ථික වර්ධනයට විශාල දායකත්වයක් සැපයූ ජන කොටසක් ලෙස මුස්ලිම්වරු කටයුතු කර ඇත.

### ආශ්‍රිත ග්‍රන්ථ


Abeysinghe T.B.H., (1966). *Portuguese Rule in Ceylon*, 1594-1612, Lake house Investment, Colombo.

Cader, M.L.A., (2015). *Exploring Sri Lanka Muslims: Selected Writings of M.M.M. Mahroof*, South Eastern University of Sri Lanka.

Devaraja, L., (2013). *Muslims of Sri Lanka: Coexistence of Ethnics in Thousand Years*, 2nd Edition, Islamic Foundation of Sri Lanka.

Hussein, A., (2018). *Spring of Saylan: The Muslim contribution to Sri Lanka*, Sailan Muslim Foundation, Colombo.

Knox, Robert, (1981). A *Historical Relation of Ceylon, In the east indies,* Richard Chiswell, printer to the royal society, London

Shukri, M.A.M., (1986). *Muslims of Sri Lanka: Avenues to Antiquity*, Jamiah Naleemiah Institute. Beruwala

Perera, E.W., (1916). *Sinhalese Banners and Standards*, Department of government printers, Colombo.

Somaratne, G.V.P., Somaratne, (1975). *Political History of the Kingdom of Kotte*, 1400-1521, Ceylon.

අමීන් එම්. අයි. එම්., (2000). *ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ප්‍රතිසංස්කරණ වලට මුල් වූවන්*, අල් හසනාත්, හෙම්මාතගම

අසීස් එම්. ඒ. එම්., (2007), *ශ්‍රී ලංකාවේ ඉස්ලාම්* , කුමරන් ප්‍රකාශන, කොළඹ

අබ්දුර් රහීම්, *ඉස්ලාමීය විශ්වකෝෂය I ,II*, යුනිවසල් ප්‍රකාශන

අෆ්ලල්, එම්. එම්., (2015). *බෞද්ධ, ඉස්ලාම් සුහදත්වය සහ මුස්ලිම් සමාජය*, දෙහිවල.